# <u>ඉට්ඨ සූත්‍රය</u>
## <u>ශ්‍රී ලංකාරාමය - 17.10.20</u>
## <u>නවසීලන්තය</u>

හොඳයි, මේ කියන ධර්ම කාරණා ටික හැම කෙනාටම ඉතාමත් හොඳින් වැටහේවා අවබෝධ වේවා තේරුම් ගන්න ලැබේවා කියලා බොහෝම මෛත්‍රීයෙන් කරුණාවෙන් ආශීර්වාද කරනවා, ප්‍රාර්ථනා කරනවා. මෙය ඒකාන්තයෙන්ම මේ පින්වතුන්ගේ හිත් නිවාගෙන හිත් සනසාගෙන ධර්මඥාණය වඩාගෙන නිවනින් සැනසෙන්න නිවන් ගමන යා ගන්න හොඳ ශක්තියක්ම වේවා කියලා ආශිර්වාද කරනවා.

දවසක් අනාථපිණ්ඩික සිටුතුමා බුදුරාජාණන්වහන්සේ බැහැ දකින්න ගියා. වරින් වර වරින් වර අනාථපිණ්ඩික සිටුතුමා බුදුරාජාණන්වහන්සේ බැහැ දකින්න යනවා. උදේටත් යනවා දවාලටත් යනවා හැන්දෑවටත් යනවා. උදේට යනකොට ආහාරපාන අරගෙන යනවා, හැන්දෑවට යනකොට ගිලන්පස හදාගෙන යනවා. ඒවගේ ගිහිල්ලා බුදුරාජාණන්වහන්සේට වන්දනා කරලා පැත්තකින් ඉන්න ගමන් බුදුරාජාණන් වහන්සේ අනාථපිණ්ඩික සිටුතුමාට කරුණු කීපයක් කියලා දෙනවා. මේ කරුණු ටික මේ පින්වතුන්ට වැදගත් වෙනවා. නමුත් දේශනා කළේනම් අනාථපිණ්ඩික සිටුතුමාට. එයා millionaire කෙනෙක්. මේක එතුමාටත් වටිනවා අපිටත් ලෝකයේ බොහෝ අයටත් වටිනවා.

කවදාකවත් අනාථපිණ්ඩික සිටුතුමා ගිහිල්ලා 'අනේ ස්වාමීනි මට මෙන්න මෙහෙම ප්‍රශ්නයක් තිබෙනවා' කියලා ප්‍රශ්න අහන්නේ නෑ. බුදුරාජාණන්වහන්සේව හරියට පරෙස්සම් කරනවා. අනාථපිණ්ඩික සිටුතුමා බුදුරාජාණන්වහන්සේ මහන්සිවෙයි කියලා ප්‍රශ්න අහන්නේ නෑ. ඒ වෙලාවේදී බුදුරාජාණන්වහන්සේ අනාථපිණ්ඩික සිටුතුමාට මේ විදියට කියනවා.

**"පඤ්චිමෙ, ගහපති, ධම්මා ඉට්ඨා කන්තා මනාපා දුල්ලභා ලොකස්මිං කතමෙ පඤ්ච? ආයු, ගහපති, ඉට්ඨො කන්තො මනාපො දුල්ලභො ලොකස්මිං; වණ්ණො ඉට්ඨො කන්තො මනාපො දුල්ලභො ලොකස්මිං; සුඛං ඉට්ඨං කන්තං මනාපං දුල්ලභං ලොකස්මිං; යසො ඉට්ඨො කන්තො මනාපො දුල්ලභො ලොකස්මිං; සග්ගා ඉට්ඨා කන්තා මනාපා දුල්ලභා ලොකස්මිං. ඉමෙ ඛො, ගහපති, පඤ්ච ධම්මා ඉට්ඨා කන්තා මනාපා දුල්ලභා ලොකස්මිං.**

ගෘහපතිය මේ ලෝකයේ ධර්මතා 5 ක් තිබෙනවා. ඒ ධර්මතා 5 හරිම හැඩයි හරිම විසිතුරුයි. ඉතාමත්ම කාන්තිමත් හිතට ප්‍රිය වඩනවා. නමුත් මේවා හැම තැනම නෑ, ඒක නිසා දුර්ලභයි = **ඉට්ඨා කන්තා මනාපා දුල්ලභා ලොකස්මිං**. හැම තැනම තිබෙනවා නම් හැම තැනින්ම ගන්න පුළුවන් නම් ඒකෙ වටිනා කමකුත් නෑ. මේ කරණා 5 ලෝකයේ අතිශයෙන්ම දුර්ලභ අතිශයෙන්ම හිඟ කාරණා 5 ක්.

හොඳට බලන්න අපි දැන් masks දානවා. අපි ඒ masks දාන්නේ විසබීජ වලින් ආරක්ෂා වෙන්නේ ජීවිතිය ජීවත් කරවන්න අවශ්‍ය නිසා හින්දයි. මේ පංච ස්කන්ධ set එක, මේ ඇස් දෙක, කන, නාසය, මේ ජීවිතිය තව ටිකක් කල් පවත්වාගෙන යන්න අපි කැමැතියි.

මේ වටිනා දුර්ලභ කරුණු පහෙන් පළවෙනි එක තමයි ආයුෂය = **ආයු, ගහපති, ඉට්ඨො කන්තො මනාපො දුල්ලභො ලොකස්මිං**. ආයුෂය කියන්නේ ජීවත් වීම. ඒක ලෝකයේ හරි දුර්ලභයි. අවුරුදු 100 ක් 120 ක් වගේ කාලයක් නිරෝගීව ජීවත් වෙලා ඉන්න අය ලෝකයේ ඉන්නවා නමුත් හරි අඩුයි. ඒකයි දුර්ලභයි කියලා කියන්නේ. ස්වාමීන් වහන්සේලා අතරත් ඉන්නවා නමුත් හරි අඩුයි.

ඒවගේම තමයි ආයුෂය තිබුණට ජීවිතය පරණ වෙනවාට අපි කැමති නෑ. ඒක ටිකක් වැඩියෙන් ගියා කියලා කියන්නත් කැමති නෑ. මාත් එක්ක හිටියා දොස්තර මහත්මයෙක්, අපේ අසෝකා දොස්තර මහත්මයා නොවෙයි. අපි දෙන්න එකට වීසා වලට apply කළා. වීසා apply කරන කොට ඒ මහත්මයාගේ passport එක මට දුන්නා. හාමුදුරුවෝ කෙනෙක් යනකොට සලකා බලන නිසා මගේ passport එකයි එයාගේ passport එකයි තමයි මම ගිහිල්ලා දුන්නේ office එකට. මම ඒ වෙලාවේ එයාගේ උපන් දිනය බැලුවා. දවසක් අපි casual conversation එකක් ගත්තා. ඒ මහත්මයා හොඳ පෙනුමක් තිබෙන handsome මනුස්සයෙක්. කථා කරගෙන යනකොට මම ඇහුවා මහත්මයාගේ වයස මොකක්ද කියලා. ඒ මහත්මයා අවුරුදු දෙකක් අඩු කරලා කිව්වේ. මේ මාත් එක්ක එකට යන මහත්මයා. මම කල්පනා කළා ඇයි මෙහම කියන්නේ කියලා. ඒ මහත්මයා රැක්කේ නැති උනාට පන්සිලුත් සමාදන් වෙනවා. බණත් කියන්න යනවා ධර්ම සාකච්ඡාත් කරනවා. නමුත් මට ආයුෂය කිව්වේ දෙකක් කපලා.

ඒකෙ තිබෙන යතාර්ථය බලන්න. ඇයි එහෙම කියන්න හේතුව. ඒකට හේතුව තමයි වැඩියෙන් වයස යනවාට අපි කැමති නෑ. ඒක නිසා ආයුෂයට කට්ටිය කැමතියි. ආයුෂය අඩුවෙන් කියනවා කියන්නේ මම තව අවුරුදු දෙකක් වැඩියෙන් ඉන්නවා කියන එක. තවත් අවුරුදු දෙකක් වැඩියෙන් ඉන්නවා කියන පැත්තට බරක් තිබෙන්නේ. අපි ආයුෂය කියන්න කැමති නෑ. නමුත් ජීවත් වෙන්න කැමතියි.

තවත් එකක් තමයි මම ප්‍රවෘත්තියක් අහලා තිබෙනවා. දැන් මේ රටේ නවසීලන්තයේ තිබෙනවා euthanasia referendum එකක්. ඒක initiate උනේ Scandinavian රටක. ඒ රටේ දොස්තර මහත්මයෙක් තමයි ඕක ආරම්භ කරලා තිබෙන්නේ. මම මේ දැන් කියාගෙන යන්නේ අනාථපිණ්ඩික සිටුතුමාට දේශනා කළ කාරණයක් වන ආයුෂය පිළිබඳව. සමහරු කෙටි ආයුෂයෙන් මැරෙනවා. දිර්ඝායුෂ ලබන අය හරි අඩුයි. මම euthanasia පිළිබඳ වීඩියෝ clips බලලා තිබෙනවා. එකේදී බොන්න දෙයක් දෙන්නේ.

එක දොස්තර කෙනෙක් ලෙඩෙක්ව motivate කළා මැරෙන්න. එයාට මැරෙන්න දවසකුත් දුන්නා. අපි හිතමු මාස දෙකකින් කියලා. එතකොට එයා කට්ටිය ඔක්කෝටම අහවල් දවස තමයි මගේ අන්තිම දවස කියලා post card ලියුම් ලිව්වා. එතකොට ඒ දූ දරුවෝ නෑදැයෝ හිත මිත්‍රාදීන් කල්පනා කළා අපේ මේ නෑදෑයාගේ අවසාන දවසට යන්න ඕනෑ කියලා තෑගී බෝග අරගෙන මල් අරගෙන ඊට කලින් දවසක ආවා. ඉතින් ඒ අය wish කරනවා 'අපි ඔක්කොම එකට හිටියේ අපි එකට ඉස්කෝලේ ගියා' කියලා හරිම සන්තෝසෙන් එයත් එක්ක කථා කරලා ගියාට පස්සේ දොස්තර මහත්තයා ඇවිල්ලා තිබෙනවා එයාගේ preparation එකට. මෙයා හිතලා තිබෙනවා 'මෙච්චර මේ යාලු හිත මිත්‍රාදීන් ඇවිල්ලා මට wish කරද්දී මම මොනවටද මැරෙන්නේ' කියලා. එයා දොස්තර මහත්මයාට කියලා තිබෙනවා 'මම මගේ decision එක වෙනස් කළා' කියලා. දොස්තර මහත්මයා කියලා තිබෙනවා 'එහෙම කරන්න බෑ, දැන් sign කළා නේද' කියලා නැවතත් euthanasia වලට motivate කරලා තිබෙනවා. ඊට පස්සේ දොස්තර මහත්මයාට නඩුවක් ආවා ජීවත් වෙන්න ඉන්න එක්කෙනෙක් මැරෙන්න motivate කළේ ඇයි කියලා. එතකොට දොස්තර මහත්මයා කියලා තිබෙනවා වෙන ලෙඩෙක්ව දාන්න ඇඳ ඕන උනා කියලා. බලන්න මේවාගේ තිබෙන ස්වභාවය. අපි කොච්චර කිව්වත් ආයුෂයට අපි කැමතියි. ජීවත් වෙන්න කැමතියි. දෙවියොත් ජීවත් වෙන්න කැමතියි. දෙවියෝ චුත වෙන්න ළං වෙන කොට marks වගයක් ඇතිවෙනවලු. එතකොට දෙවියොත් බය වෙනවලු. ශක්‍රදේවේන්ද්‍රයොත් බය වෙනවලු.

ඒක නිසා ලෝකයේ අපිට නියම ආයුෂයක් විඳලා සන්තෝසයෙන් මේ ජීවිතියෙන් යන්න තිබෙනවා නම් ඒක ආශීර්වාදයක්. ඒක blessing එකක්. ඒක නිසා බුදුරාජාණන් වහන්සේ දේශනා කරනවා **ආයුෂය** කියන එක ලෝකයේ ඉතාමත්ම දුර්ලභ කාරණයක් කියලා.

දෙවැනි කාරණය තමයි ලස්සන, හැඩ. හැඩ වැඩ කරන්න ප්‍රිය මානපව අඳින්න පළඳින්න පීරන්න ඒවගේම මොකක් හරි පාටක් ගා ගන්න ලස්සනට ජීවත් වෙන්න හැම එක්කෙනාම කැමතියි. ඇත්තටම ස්වභාවිකව ලස්සනක් නැති හින්දා තමයි පිටින් ආරෝපණය කරන්නේ. ඒක තමයි ඇත්ත. අපිට ජීවිතියෙන් ලැබිච්ච දේවල් අඩුපාඩු සහිතයි. ඒවා ජීවිතය සමාජ ගත කරන්න තරම් මදි. ඒක නිසා අපිට මොකක් හරි බෝතල් කුප්පි ටිකක් එකතු කර ගන්න අවශ්‍ය වෙනවා. කොණ්ඩයක් නැත්නම් අනිත් එක්කෙනෙකුගෙ කොණ්ඩයක් හරි ගුලි කරලා පාවිච්චි කරන්න සිද්ධ වෙනවා. ඒ ක්‍රියාවේ ඇතුලාන්තය තමයි, අපි ලස්සනට කැමතියි, අපි හැඩ වැඩ වෙන්න

කැමතියි, ප්‍රිය මානප වෙන්න කැමතියි. මේ තමයි දෙවෙනි කාරණය. මේක දේශනා කරන්නේ අනාථපිණ්ඩික සිටු තුමාට.

පළවෙනි කාරණය තමයි ආයුෂය. ගොඩක් කල් ජීවත් වෙන්න කැමතියි. දෙවැනි එක තමයි ජීවත් වෙන කාලයේදී ලස්සනට ජීවත් වෙන්න කැමතියි. අපි මළ ගෙදරකට ගියහම ඒ මළ ගෙදරට ඇවිල්ලා ඉන්නා වූ හැරමිට්ටෙන් යන්නා වූ ආච්චි අම්මා පවා ලස්සනට ඇඳලා පැළඳලා කොන්ඩේ පීරලා මල් ගහලා තමයි එන්නේ. එයා ජරාවට යන කථාව වෙන එකක් නමුත් ලස්සන වෙන්න එයා කැමතියි. ඒ ලස්සන වෙන්න කැමති ලස්සන කියන එක ඉබේ එන්නේ නෑ. ඒක දුර්ලභයි. උපතින්ම ලස්සන වෙලා උපදින අය හරි දුර්ලභයි.

තුන්වෙනි කාරණය තමයි අපි හැමදෙනාම කැමතියි සැපයට. සීතල නම් උෂ්ණය අවශ්‍යයි. උෂ්ණයි නම් සීතල අවශ්‍යයි. අපිට වාඩිවෙන කොට පවා පහසුවෙන් වාඩිවෙන්න අවශ්‍යයි. ආහාර උනත් අපි රසට හදාගන්න කැමතියි. ඒවගේම වාඩිවෙන තැන නිදාගන්න තැන හොඳට පිරිසිදුව තබා ගන්න අපි කැමතියි. ඒ අපි සැපයට කැමති නිසා. ඒක නිසා මේ සැපය ලෝකයේ දුර්ලභයි. සැපය කියන එක ආහාර පාන වශයෙන් ආඝ්‍රාණය වශයෙන් යම්කිසි දෙයක් පෙනීම වශයෙන් ශරීරයට අතට පයට සෑම තැනකටම දැනීම් වශයෙන් සැපයක් අවශ්‍යයි. නමුත් මේ සැපය හැමෝටම නෑ. බුදුරාජාණන්වහන්සේ දේශනා කරනවා සැපය කියන එක දුර්ලභ කාරණයක් කියලා.

අපි හැමෝම කැමතියි අනිත් අය අපි දිහා බලනවට. ඒක නිසා මානයක් එන එක හැබෑව. එහෙම නැත්නම් කොණ්ඩේ තිබෙන අය කොණ්ඩේ පීරයිද පාට කරයිද. යම්කිසි කෙනෙක් ප්‍රියයි නම් ඒ ප්‍රිය මනාප කෙනා දකින කෙනාටත් සතුටක් දැනෙනවා. ඒක නිසා මේක දුර්ලභ කාරණයක් හැටියට තමයි සලකන්නේ.

හතරවෙනි කාරණය තමයි යසස, කීර්තිය කියන එක. යසස කියන්නේ පිරිවර ඉන්නවා කියනඑක. ඒ පිරිවර අපිට උදව්වටම නොවෙයි නමුත් අපිව පිළිගත්ත කොටසක් ඉන්නවා. උදව් උපකාර කරන්න පිරිසක් ළඟ ඉන්නවා. නෑ දෑ හිත මිත්‍රාදීන් ඉන්නවා. ඒත් යසසම තමයි. සමහර අයගේ නම් කියපු ගමන් හරි පිළිගැනීමක් පැහැදීමක් ප්‍රශංසාවක් උදව් උපකාර කිරීමට ඉදිරිපත් වීමක් තිබෙනවා. ඒ වගේ කීර්තිය ප්‍රශංසාව කියන එක ලෝකයේ හැම කෙනාටම නෑ. අනිත් ඒවානම් මොනවා හරි කරලා ගන්න පුළුවන්. මේක නම් ගන්නම බෑ. වර්ණය කියන එක නම් කොහොම හරි මොනවා හරි කරලා හරි ගන්න පුළුවන්. නමුත් යසස කියන එක එහෙම ගන්න බෑ. ඒක අවංකවම ලැබිය යුතු දෙයක්. යසස තිබෙන කොට අපිව වර්ණනා කරනවා අපේ ගුණ කියනවා. ඒ හැම කෙනාගේම හිත ඒ පැත්තට නැමිලා තිබෙනවා. දෙවියොත් ගුණ කියනවා. මනුස්සයොත් ගුණ කියනවා. නෑදෑයෝත් ගුණ කියනවා. ඒ වගේ හොඳ කීර්තියක් යසසක් පිරිවරක් ලබනවා කියන එක ලෝකයේ හැම එක්කෙනාටම හම්බ වෙන්නේ නෑ.

අනිත් කාරණය තමයි ස්වර්ග සම්පත්තිය = **සග්ගා ඉට්ඨා කන්තා මනාපා දුල්ලභා ලොකස්මිං**. ඒ කියන්නේ ස්වර්ගයේ උපදිනවා කියන එක. මනුස්සලෝකයේ හරි දිව්‍යලෝකයේ හරි උපදිනවා කියන එක දුර්ලභයි. ඒ කියන්නේ බුදුරාජාණන් වහන්සේගේ නුවණින් දකිනවා ගොඩක් මැරිලා ගිහිල්ලා උපදින්නේ අපායේ. තිරිසන් ලෝකයේ. මම කියලා තිබෙනවා ඔය බල්ලෝ බළල්ලු ආවොත් කන්න දෙනවා නමුත් අත පත ගාන්න යන්නේ නෑ. ඒකට හේතුව බල්ලෝ හුරතල් කරන්න ගියහම බල්ලෝ ආදරේ කරලා තබා ගැනීම නිසා උදේටත් හන්දෑවටත් දවාලටත් එයාට වැඩ කරන්නේ බල්ලා පිළිබඳ සිතක්. ඒ සිත උදේටත් එහෙමයි හැන්දෑවටත් එහෙමයි දවාලටත් එහෙමයි. එයා බල්ලා ගැනමයි කියන්නේ. බල්ලා ගැනමයි කථා කරන්නේ. බල්ලාට බැඳිලා ආදරෙයි. ඒක attachment එකක්. ඊට පස්සේ මැරිලා ගිහිල්ලා බල්ලෙක් වෙලා උපදිනවා. පූසන්ටත් ඒ වගෙයි. සමහර අය ගෙදර හුරතලේට සර්පයෝ හදනවා. මැරිලා ගිහිල්ලා උපදින්නේ ඒ වගේ ගුහාවක. බුදරජාණන් වහන්සේ දකිනවා මිනිස්සුන්ගේ හිත්වල තිබෙන බැඳීම.

මම ඇත්තටම මේ සූත්‍රය අරගත්තේ මේ නවසීලන්තයේ ඕක්ලන්ඩ් වල ඉන්න කට්ටිය මේ ධර්ම ශාලාව පිරෙන්න ඉඳලා යම්කිසි වෙලාවක වෙන කොහේ හරි ඉපදිලා ඉන්නවා දැක්කොත් මට මොනවාද හිතෙන්නේ. දෙවිවරු මට මොනවාද කියන්නේ. ඔන්න ජිනාලංකාර හාමුදුරුවන්ගේ බණ අහලා වෙච්ච හරිය කියල කියයි. ඒක නිසා හැම වෙලාවේම පරෙස්සම් වෙන්න. මේවා හදලා කියන ඒවා නොවෙයි. මේවා තිබෙන දේවල්. සත්තුන්ට ආදරේ කරනවා කියන එක ලෝභ කමක්. කන්න දෙනවා කියලා කියන්නේ කරුණාව. පසේ

බුදුරාජාණන්වහන්සේලාත් සත්වයන්ට කන්න දීලා තිබෙනවා. කුම්භ ගෝෂකගේ පූර්ව ජාතිය එහෙමයි. ඉතින් මේ වගේ ස්වර්ගයේ උපදින්න ලැබෙනවා කියන එක හරිම දුර්ලභයි.

ගොඩක් මිනිස්සු කරපු ලෝබයකින් ගිහිල්ලා එක්කෝ ප්‍රේත ලෝකයේ නැත්නම් කරගත්තු පාපයකින් අපායේ එහෙමත් නැත්නම් සර්පයෙක් වෙලා නැත්නම් කිඹුලෙක් වෙලා උපදිනවා. මස් වලට ගිජු උන එක්කෙනා කිඹුල්ලු වෙනවා. අනිත් අය ගසාගෙන මරාගෙන කන්න කැමති අය ඒ වගේ හිතක් දැරුවට පස්සේ ඒ විදියට උපදිනවා.

ආයුෂය වර්ණය සැපය යසස ස්වර්ගයේ ඉපදීම යන මේ ධර්ම කාරණා 5 අපි හැමදෙනාම වැඳගෙන පතනවා. නමුත් බුදුරාජාණන් වහන්සේ මෙසේ දේශනා කරනවා,

**'ඉමෙසං ඛො, ගහපති, පඤ්චන්නං ධම්මානං ඉට්ඨානං කන්තානං මනාපානං දුල්ලභානං ලොකස්මිං න ආයාචනහෙතු වා පත්ථනාහෙතු වා පටිලාභං වදාමි** = මේ පහම ප්‍රාර්ථනා කළ පමණින් එන්නේ නෑ. අයාචනා කරපු මාත්‍රයෙන් එන්නේ නෑ. ඉල්ලූ මාත්‍රයෙන් එන්නේ නෑ.

මිනිස්සු දෙවියන්ට සත 50 ක් හරි රුපියලක් හරි දාලා කෝටියක list එකක් බලාපොරොත්තුවනවා. වාහනය රථ ගන්න ඕනෑ. කොස් ගහේ ගෙඩි එන්න ඕනෑ. පොල් ගහ පීදෙන්න ඕනෑ. නඩුවක් දිනන්න ඕනෑ. නමුත් දෙන්නේ පොඩ්ඩයි. ඒ තරම් ලෝභ හිතකින් එතනට යන්නේ.

ඒක නිසා මේ ආයුෂය කියන එක ප්‍රාර්ථනා කරලා ආයාචනා කරලා හිතලා පතලා ලබන්න බෑ කියලයි බුදුරාජාණන් වහන්සේ දේශනා කරන්නේ. වර්ණය ලස්සන වීම හැඩ වැඩ වීම ආයාචනා කරලා ප්‍රාර්ථනා කරලා අධිෂ්ඨාන කරලා ලබන්න බෑ. සැපය කියන එකත් කවදාකවත්ම ආයාචනා කරලා ප්‍රාර්ථනා කරලා අධිෂ්ඨාන කරලා හිතලා පතලා ගන්න බෑ. ඒක එන්නේ නෑ. ඒවගේම යසස කිර්තිය ප්‍රාර්ථනා කළාට පැතුවට එන්නේ නෑ.

එක තැනක සිද්ධ වෙච්ච සිදු වීමක් මම කියන්නම්. දකුණු පළාතේ එක වලව්වක අයට මම දන්නවා පොල් වතු තිබෙනවා ඉඩ කඩම් තිබෙනවා කුඹුරු තිබෙනවා ඔක්කොම තිබෙනවා. පරණ සේවක සේවිකාවෝ ඉන්නවා. අලුත් අය එහෙම එන්නේ නෑ. එයාට ඉඩ කඩම් තිබෙනවා වස්තුව තිබෙනවා ඒ උනාට එයාට ඒ කාලේ එයාව අමතන්න හාමු කියන වචනය පාවිච්චි කරන්නේ නෑ. මහත්මයා කියලයි කිව්වේ. ඒ ගෙදරට වැඩ කරන්න එනවා ඒ ගමේ ළමයි. ඉතින් මහත්තයා සර් කියලා කියනකොට මෙයා කැමතියි හාමු කියන වචනයට. ඒ කාලේ හැටියට රුපියලක් රුපියල් දෙකක් කියලා කියන්නේ ලොකු ගානක්. ඉතින් මෙයා අර ළමයින්ට රුපියලක් රුපියල් දෙකක් වගේ දෙනවා හාමු කියලා කියව ගන්න. ඒ කියන්නේ කීර්තියක් හොඳ නමක් කියවගන්න. ඒ ළමයි දැනගත්තා මේ වැඩේ. ළමයි උදේට යන්නේ හාමු කොහොමද කියාගෙන. ගිහිල්ලා ඒ වචනය කිව්වට පස්සේ සල්ලි දෙනවා. හාමු කිව්වහම සල්ලි දෙන නිසා තව තව ළමයි එනවා. මේ ළමයි ඒ මනුස්සයට හාමු කියලා සල්ලි අරගෙන ගමේ ගිහිල්ලා කියනවා අපි හාමු කියලා ගත්තු සල්ලි තමයි මේ කියලා. ඒකෙන් වෙන්නේ අර මනුස්සයට ඉස්සෙල්ලා තිබුණ කීර්තියත් නැති වෙලා යනවා. කිර්තිය, හොඳ නම කවදාකවත් සල්ලි දීලාවත් ගන්න බෑ. ඒක ස්වභාවයෙන් අපි කරන හොඳ දේකින්ම තමයි එන්නේ.

ඒක නිසා බුදුරාජාණන්වහන්සේ දේශනා කරනවා මේවා ආයාචනා කරලා ගන්නත් බෑ ප්‍රාර්ථනා කරලා ගන්නත් බෑ කියලා.

ඊළඟට බුදුරාජාණන් වහන්සේ මෙසේ දේශනා කරනවා **ඉමෙසං ඛො, ගහපති, පඤ්චන්නං ධම්මානං ඉට්ඨානං කන්තානං මනාපානං දුල්ලභානං ලොකස්මිං ආයාචනහෙතු වා පත්ථනාහෙතු වා පටිලාභො අභවිස්ස, කො ඉධ කෙන හායෙථ?** = ගෘහපතිය මේවා හිතපු පතපු විදියටම එනවා නම් කාටද මේවා අඩුපාඩු?

හැමෝම හිතනවා මට වාහන ඕනෑ කීර්තිය ඕනෑ ප්‍රශංසාව ඕනෑ ලස්සන වෙන්න ඕනෑ කියලා. උදේටත් හිතනවා පන්සිල් සමාදන් වෙලා හෝ නැතුව හැන්දෑවටත් හිතනවා. ඉතින් ඔහොම හිතනකොට ඕවා එනවද? මේවා හිතු පමණින් එන්නේ නෑ. එහෙම එනවානම් ඔයහැම එක්කෙනාටම වැඩ කරන්න ඕනෑ නෑ. Hair dressing කරන්න ඕනෙත් නෑ. Fashion කරන්න ඕනෙත් නෑ. මමත් තරුණ කාලේ shirt කලිසන් මදින ඒවා කළා නමුත් දැන්

කරන්නේ නෑ. අපිට හැම දේම ප්‍රාර්ථනා කළ පමණින් ලැබෙනවා නම් අපිට මේවා මුකුත් කරන්න ඕන වෙන්නේ නෑ. මේ හැම දේකටම උත්සාහයක් අවශ්‍යයයි. මේ හැම එකකටම යම්කිසි කැප කිරීමක් අවශ්‍යයි.

හිතුවට පැතුවට ආයුෂය ලැබෙන්නේ නෑ. හිතුවට පැතුවට ලස්සන ලැබෙන්නේ නෑ. හිතුවට පැතුවට සැපය ලැබෙන්නේ නෑ. හිතුවට පැතුවට ළමයෙක් හම්බවෙන්නෙ නෑ. සමහර පවුල් ඉන්නවා ළමයි නෑ. ඒ ගොල්ලෝ බාර වෙනවා නොයෙක් දේවල් කරනවා. සමහරු අවුරුදු 50 ක් විතර වෙනකම් හැම දේම කර කර ඉඳලා පස්සේ අතහැරලා දානවා. මම මේවා මිනිස්සුත් එක්ක communicate කරනකොට දැන ගත්ත දේවල් . මේවා හිතුවට පැතුවට එන්නේ නෑ. ළමයි ලැබෙන්නේ නෑ, කෑම හම්බ වෙන්නේ නෑ, නිරෝගී කම ලැබෙන්නේ නෑ. ලස්සන වෙන්නේ නෑ. මොක්වත් එන්නේ නෑ.

ඊළඟට අපි හිතාගෙන ඉන්නවා මට යසස ඇතිවේවා කියලා. ඒත් හම්බ වෙන්නේ නෑ. අනිත් එක තමයි දිව්‍ය හෝ මානුසික හෝ වේවා සැපයක් තිබෙනවා නම් අපි හිතුවට ලැබෙන්නේ නෑ. අපි හිතුවට පැතුවට අධිෂ්ඨාන කළාට දිව්‍ය ලෝකවල ඉපදෙන්න බෑ. මනුස්සලෝකයට අපිට එන්න ඕන උනාට එහෙම උපදින්නේ නෑ. ඒ උනාට මේ ඉන්න හැමදෙනාටම තිබෙනවා මෙවැනි ආසාවල්. ඒක බුදුරාජාණන්වහන්සේ දකිනවා. ඒක නිසා බුදුරාජාණන් වහන්සේ මෙහෙම දේශනා කරනවා.

**'න ඛො, ගහපති, අරහති අරියසාවකො ආයුකාමො ආයුං ආයාචිතුං වා අභිනන්දිතුං වා ආයුස්ස වාපි හෙතු. ආයුකාමෙන, ගහපති, අරියසාවකෙන ආයුසංවත්තනිකා පටිපදා පටිපජ්ජිතබ්බා. ආයුසංවත්තනිකා හිස්ස පටිපදා පටිපන්නා ආයුපටිලාභාය සංවත්තති. සො ලාභී හොති ආයුස්ස දිබ්බස්ස වා මානුසස්ස වා.**

**"න ඛො, ගහපති, අරහති අරියසාවකො වණ්ණකාමො වණ්ණං ආයාචිතුං වා අභිනන්දිතුං වා වණ්ණස්ස වාපි හෙතු. වණ්ණකාමෙන, ගහපති, අරියසාවකෙන වණ්ණසංවත්තනිකා පටිපදා පටිපජ්ජිතබ්බා. වණ්ණසංවත්තනිකා හිස්ස පටිපදා පටිපන්නා වණ්ණපටිලාභාය සංවත්තති. සො ලාභී හොති වණ්ණස්ස දිබ්බස්ස වා මානුසස්ස වා. .....**

අපි සෝවාන් උනේ නැතත් සකෘදාගාමී අනාගාමී අරිහත් උනේ නැතත් බුදුරාජාණන්වහන්සේගේ ආර්ය සීලය රකින්නා වූ ශ්‍රාවකයෝ. ආර්ය ධර්මය පිළිගත්තු ශ්‍රාවකයෝ. එවැනි බුදුරාජාණන්වහන්සේගේ ශ්‍රාවකයන්ට ඒ පතන වැඩේ ගැලපෙන්න නැතිලු. ඒකයි මේ බුදුරාජාණන් වහන්සේ දේශනා කරන්නේ. හේතු ඵල ධර්මය දේශනා කරපු බුදුරාජාණන් වහන්සේගේ ශ්‍රාවකයෝ වන අපි ඔය වගේ හිතන පතන දේවල් වලට ගැති වෙලා ඉන්න එක හොඳ නෑ ගැලපෙන්නේ නෑ කියලයි මේ කියන්නේ.

ආයුෂය කැමති ආර්ය ශ්‍රාවකයා ආයුෂය ප්‍රාර්ථනා කරන්න ආයුෂයට කැමති වෙන එක ගැලපෙන්නේ නෑ. ආයුෂයට කැමති අපි හැම එක්කෙනාම දිව්‍යලෝකයට ගිහිල්ලා ටික කාලයක් ඉඳලා එන්න වෙන්නේ නැතුව සම්පූර්ණ කාලයම එහෙ ගත කරන්න කැමති නම් හෝ බ්‍රහ්ම ලෝකයට ගිහිල්ලා එහි සම්පූර්ණ කාලයම ඉන්න කැමති නම් හෝ මනුස්සලෝකයේ දිගු කාලයක් ජීවත් වෙන්න කැමති නම් හෝ ආයුසංවත්තනික ප්‍රතිපදාව පුරන්න ඕනෑ. ඒ කියන්නේ ආයුෂය ලැබෙන වැඩක් කරන්න ඕනෑ. ලස්සන වෙන්න නම් වණ්ණසංවත්තනික ප්‍රතිපදාව පුරන්න ඕනෑ. දිගු කල් ජීවත් වෙන්න කැමතිනම් ඒකට අවශ්‍ය ප්‍රතිපදාවක් තිබෙන්න ඕනෑ. ඒ ජීවත්වන කාලයේ හැඩට ඉන්න නම් ඒකට තව ප්‍රතිපදාවක් තිබෙන්න ඕනෑ. සැපය ලබාගන්නත් තිබෙනවා එක්තරා practice එකක්. සැපයෙන් ඉන්න ඕනෑ නම් සුඛසංවත්තනික ප්‍රතිපදාව පුරන්න ඕනෑ. ඒවගේම යසස ඕනෑ නම් යසසංවත්තනික ප්‍රතිපදාවක් තිබෙනවා. ඒ ප්‍රතිපදාව පුරන්න ඕනෑ. ස්වර්ගයේ උපදින්න නම් ස්වර්ග සංවත්තනික ප්‍රතිපදාව පුරන්න ඕනෑ.

අපි හේතුවක් උත්පාදනය කරහම ඒකෙන් ඵලයක් ලැබෙනවා = cause and effect. කර්මයක් නිෂ්පාදනය කරහම විපාකයක් ලැබෙනවා. දැන් බලන්න, විසඛා මහා උපාසිකාව ආයුසංවත්තනික ප්‍රතිපදාව පුරලා තිබුණා. ඒක නිසා විසාඛාව අවුරුදු 120 ජීවත් උනා. ආනන්ද ස්වාමීන් වහන්සේ අවුරුදු 130 ක් වැඩ සිටියා.

විසඛාව ලස්සනයි පංච පඤ්චකල්‍යාණයෙන් යුක්තයි. පඤ්චකල්‍යාණය කියන්නේ කේස කල්‍යාණය, දන්ත කල්‍යාණය, මාංස කල්‍යාණය, ඡවි කල්‍යාණය සහ ආයු කල්‍යාණය.

1) කේස කල්‍යාණය කියන්නේ කාන්තාවකට මොණරෙකුගේ පිල් වගේ පහතට වැටුණු ලස්සනට ගලාගෙන දිය රැල්ලක් වගේ විළුඹ ගාවට තිබෙන කෙස් වලට. මෙවැනි කෙස් කළඹක් ලැබෙන්නේ පිනකට. ඒ කෙස් අවුරුදු 40 – 50 වෙනකොට සුදු වෙන්නේ නෑ. ඒ අයගේ ශරීරය පිහිටලා තිබෙන්නේ ඒ විදියටයි.

2) දන්ත කල්‍යාණය කියන්නේ හිඩැස් නැතුව කැඩුම් නැතුව එක සමානව ලස්සනට පිහිටපු නිරෝගීමත් සම දත් වලට. ඒ දත් පිහිටන්න පිං කරලා තිබෙන්න ඕනෑ. අනිත් අයට බැණලා නැතුව ඇද කුද නොකර තිබෙන්න ඕනෑ. ඒ හොඳ ක්‍රියාවන්ගේ ප්‍රතිඵලයකට තමයි දන්ත කල්‍යාණය ලැබෙන්නේ.

3) මාංස කල්‍යාණය කියන්නේ ශරීරයේ මාංස පිහිටීම මධ්‍යම ප්‍රමාණිකව හැඩට තිබීම. කිසිම විරූපිකමක් නැතුව ශරීරයේ මාංස සමව ලස්සනට පිහිටන්නේ පිනක් නිසා.

4) ඡවි කල්‍යාණය කියලා කියන්නේ කාන්තාවකගේ ශරීරයේ සමව පිහිටන මස් වලට පිටින් පිහිටන golden colour ලස්සන පිරිසිදු පැහැපත් සම.

5) ආයු කල්‍යාණය - කේස කල්‍යාණය දන්ත කල්‍යාණය මාංස කල්‍යාණය ඡවි කල්‍යාණය යන සතර කල්‍යාණයන් සහිතව සම්පූර්ණ ආයු කාලයම ජීවත් වෙන්න ලැබීමට කියනවා ආයු කල්‍යාණය කියලා.

මේ වගේ පඤ්චකල්‍යාණයන්ගෙන් යුක්ත වෙච්ච කාන්තාවන් තුන් දෙනෙක් හිටියා ඒ කාලේ ඉන්දියාවේ. ඒ තමයි යසෝදරා දේවිය විසඛාව සහ බන්ධුලමල්ලිකාව. ඉන්දියාවේ කෝටි ගණනක් ඉන්න ජන සමාජය තුල තුන්දෙනෙකුට විතරක් මේ වරප්‍රසාද ලැබුණේ මේ කාරණය ඉතාමත් දුර්ලභ නිසා. මේ සියල්ලම වර්ණයට යටත්වන දේවල්.

ඒවගේම කෑම් බීම වලින් අඩුවක් තිබුනෙත් නෑ. විසාඛාවගේ ගෙදර හරක් විශාල ප්‍රමාණයක් හිටියා. විසඛාවට දැවැද්දට හම්බ උනේ හරක්. විසාඛාවගේ තාත්තා හරක් බලාගන්න මනුස්සයාට කිව්වලු 'මේ හරක් ටික දෙන්න මගේ දුවට යනකොට එක්කරගෙන යන්න, අනිත් හරක් කඩුල්ල දාල නවත්තන්න' කියලා. ඉතින් ඒ මනුස්සයා එක හරක් රංචුවක් ඉස්සරහට ඇරියා. එතකොට අනිත් හරක් ටික ගාල් කඩාගෙන අනිත් අය පිටිපස්සේ දිව්වා. එතකොට තාත්තා කිව්වලු 'මගේ දුවගේ පින. එක නිසා ගියාවේ' කියලා ඔක්කොම ටික ඇරියා. ගොඩක් කිරි තිබුණා. ඒ කිරි වලින් වීස් ගිතෙල් ආදී හැම දෙයක්ම ඉතිරිලා පැතිරිලා තිබුණා. ඒවා සැප දායකයි. මේ සියල්ලම ලැබෙන්න සුඛසංවත්තනික ප්‍රතිපදාව විසාඛාව ඊට කලින් සම්පාදනය කරලා තිබුණා. වර්ණය ලැබීමේ ප්‍රතිපදාව විසාඛාව පූර්ණය කරලා තිබුණා. ආයුසංවත්තනික ප්‍රතිපදාව, වැඩි කල් ජීවත් වෙන්න අවශ්‍ය වැඩ සටහන විසාඛාව හරිගස්සලා තිබුණා. ඒක නිසා මේවා කාගෙන්වත් ලබා ගත්ත දේවල් නොවෙයි. මේ සියල්ලම ලැබුනේ තමන් හදලා තිබෙන හේතු වලට අනුවයි. ඒක නිසා මේවා ප්‍රාර්ථනා කළාට හම්බ වෙන්නේ නෑ.

වර්ණය ලබන්න ආයුෂය ලබන්න අවශ්‍ය ප්‍රතිපදාව තමයි දානයක් දෙනකොට පිරුණු හිතින් දානය දෙන්න. ප්‍රිය මානප විදියට දානය දෙන්න. නිවන් ප්‍රාර්ථනා කරගෙන දානය දෙන්න. නිවන් දකිනා තෙක් 'මට සැප ප්‍රතිපදාවේ දහම් ගමන යාගන්න ලැබේවා' කියන හිතෙන් දානය දෙන්න. ඒක තමයි ප්‍රතිපදාව.

මම ස්වාමීන්වහන්සේ නමක් හැටියට ඉන්දියානු සමාජයේ දානය වළඳනවා, බුරුම කට්ටියත් එක්ක දානය වළඳනවා, තායි ස්වාමීන්වහන්සේලාත් එක්ක දානය වළඳනවා. අපේ කට්ටියත් එක්ක හැමදාම වගේ දානය වළඳනවා. බුරුමේ මිනිස්සු දානය දුන්නට පස්සේ හරි odd වැඩක් සිද්ධ වෙනවා. ඒ කියන්නේ බුරුම කට්ටිය දානේ දෙනකොට ඒ අය ළඟ ඉන්නවා. ස්වාමීන් වහන්සේලාට දානය වළඳන්න රවුම් මේස තිබෙනවා, ස්වාමීන් වහන්සේලා හතර දෙනෙක් පස් දෙනෙක් විතර එක මේසයක් වටේ බිම වාඩි වෙනවා. පුටුවල වාඩි වෙන්නේ නෑ. හැම එක්කෙනාම ගෙනල්ලා ගෙනැල්ලා දානය බෙදනවා. හැම වෙලේම මිනිස්සු බලාගෙන ඉන්නේ දීසියක මොනවා හරි ඉවර වෙනකම්. ඉවර උන් ගමන් ඉක්මනට ඒක fill කරනවා. බත් ඉවර උන ගමන් ඉක්මනට fill කරනවා. ඒ ස්වාමීන් වහන්සේලා දානය වැළඳුවට පස්සේ කරන වැඩක් තිබෙනවා. අපි ලංකාවේ ඒක කරන්නේ නෑ අසෝභන නිසා.

දානේ වළඳලා බඩ පිරුනහම burps යනවා. ඒ බුරුමේ මිනිස්සු කැමතියි ඒ සද්දේ අහන්න. එතකොට මිනිස්සු අපේ හාමුදුරුවෝ අපි පුජා කළ දානය ප්‍රිය මනාපව ඉතිරෙන්න පැතිරෙන්න වළඳලා අපිට ගොඩක් පිං සිද්ධ උනා කියලා සතුටු වෙනවා. ඒ ස්වාමීන් වහන්සේලාත් ඒක සද්දෙන්ම කරනවා. අපිට ඒක හරි odd. ඊට පස්සේ ඒ ගැන ඇහුවහම තමයි කිව්වේ ඒ culture එකේ එහෙමයි කියලා.

යම්කිසි දෙයක් දෙන කොට පිරිච්ච හිතින් දෙන්න ඕනෑ. ස්වාමීන්වහන්සේ නමකට හෝ හිඟන්නෙකුට හෝ දෙනකොට හොඳට මෛත්‍රීසහගත හැඟීමෙන් දෙන්න. ඒක තමයි ආයුසංවත්තනික ප්‍රතිපදාව. අපි එක දාන වේලක් දීපු ගමන් ආනිසංස පහක් ලැබෙනවා. ඒ තමයි ආයුෂය වර්ණය සැපය බලය ප්‍රඥාව. මේ දාන දෙනකොට අර ස්වීප් ඇදිච්ච මනුස්සයා වගේ කරන්න හොඳ නෑ.

එක මනුස්සයෙක් ස්වීප් එකක් ගත්තා. එයා හිතුවා මේක ඇදුනොත් දෙවියන්ට පිං දෙනවා, දාහකට දානයක් දෙනවා කියලා. කොහොම හරි ස්වීප් එක ඇදුනා. එයාට සල්ලි හම්බ උනා. ඊට පස්සේ ඒ මනුස්සයා සීනි ටිකක් අරගෙන ගිහිල්ලා කූඹි ගුලක තිබ්බා. එතැන කූඹි දාහකට වැඩියි. ආන්න ඒ වගේ වැඩ කරන්න හොඳ නෑ.

හැම වෙලාවේම අපි හිතන්න ඕනෑ අනිත් එක්කෙනා ප්‍රියයි කියලා. මට තරුණ කාලේ ලස්සන සිවුරක් තිබුණා. මම ආරණ්‍යය සේනාසනයක ස්වාමීන්වහන්සේ කෙනෙකුගේ ගබඩාවක් ඇරියට පස්සේ ඒ ස්වාමීන්වහන්සේ කිව්වා සිවුරක් තෝරා ගන්න කියලා. ඉතින් මම තෝරලා එක සිවුරක් තිබුණා, හරිම ලස්සනයි bright දිලිසෙන සිවුරක්. ඉතින් මම ඕක අරගෙන ඇවිල්ලා පඬු ගහලා ගත්තා. ඒ සිවුර හරිම shiny. මම ඉතින් තරුණ භික්ෂුන් වහන්සේ නමක් හැටියට ඒ සිවුර පොරවගෙන පාත්තරෙත් අරගෙන ලස්සනට වඩිනකොට හාමුදුරුවරු මම දිහා බලනවා. මම තරුණ හාමුදුරුවෝ කෙනෙක් නමුත් පිරිසේ පොඩියි. ඒ සිවුර ඇදගෙන ගියහම බැබලෙනවා. ස්වාමින්වහන්සේලා ගොඩක් කිව්වා සිවුර ලස්සනයි කොහෙන්ද කියලා. මම කිව්වා සිංහරාජ අරණ්‍යයෙන් කියලා. ඔහොම ගොඩක් ස්වාමීන් වහන්සේලා කියලා තිබෙනවා.

එක තරුණ ස්වාමීන් වහන්සේ නමක් දවසක් ඇවිල්ලා කිව්වා 'ඔබ වහන්සේගේ සිවුර හරිම හොඳයි, පෙරෙව්වහම ලස්සනයි' කියලා. ඒ ස්වාමීන්වහන්සේ ඒ සිවුර පිංකමකට දෙකකට borrow කළා. ඒ ස්වාමීන් වහන්සේ ඒ සිවුරට හරි කැමතියි. එතකොට ඒ සිවුර මට එපා වෙලා තිබුණේත් නෑ නමුත් ඒ වෙලාවේ මම හිතුවා මේ ස්වාමීන්වහන්සේ මේකට කැමතියි කියලා සිවුර හොඳට හේදුවා. හෝදලා පඬු ගැහුවා, හොඳට වේලුවා, ලස්සනට නැව්වා, උන්වහන්සේට පූජා කළා. එතැනින් ඉවරයි. එතකොට ඒ තිබ්ච්ච මානය බැබලීම මට ලැබිච්ච ඔක්කොම ටික මම ඒ ස්වාමීන්වහන්සේට පූජා කළා. එතැන ඉඳලා මගේ batten ඒ ස්වාමීන් වහන්සේ අරන් ගියා. මේක මම අත් දැකපු එකක්. වර්ණ දසකයේ අපිට සිද්ධ වූ සිදු වීම්. මම ඒක ඒ ස්වාමීන්වහන්සේට පුජා කළා ප්‍රයෝජනවත් නිසා.

**"මන්‍දා ඛිඩ්ඩා ච වණ්ණා ච - බලා පඤ්ඤා ච හායනා,**
**පබ්භාරා ච පවඩ්කා ච - මොමුහා සයනා දස"**

මනුස්සයෙක් ජීවත්වන අවුරුදු 100 ක් ගත්තොත් ඒක දහයට කඩන්න ඕනෑ. එතකොට 10 කොටස් 10 තිබෙනවා. පළවෙනි අවුරුද්දේ ඉඳලා අවුරුදු දහය වෙනකම් තිබෙන්නේ මෝඩ වැඩ කරන මන්ද දසකය. බෝල ගහන්න ගිහිල්ලා විදුරු කඩනවා වගේ නුවණ මෝරපු නැති මන්ද වැඩ කරන කාලය. අවරුදු 10 ඉඳලා අවුරුදු 20 දක්වා කාලය (මේක exact කාලයම නෙමෙයි. සාමාන්‍යවශයෙන් ගත යුතුයි) මේ කාලයේදී වැඩිපුර කරන්නේම ක්‍රීඩා. ඊට පස්සේ 20 ඉඳලා 30 දක්වා අවරුදු 10 වණ්ණ දසකය. ඒ කාලය කරන්න තිබෙන ඔක්කොම fashion කරන කාලයයි. 30 ඉඳලා 40 ය දක්වා බල දසකය. බලය කියලා කියන්නේ සල්ලි හම්බ කරන ඒවා ඔක්කොම කරන්නේ මේ කාලයට. ඊළඟට දිව්‍ය ලෝක මනුස්ස ලෝක තපස් රකින ඒවා විමුක්තිය නිර්වාණය වගේ ඔක්කෝම එන්නේ 40 ඉඳලා 50 කාලයේදී. මේ කාලය පඤ්ඤා දසකයයි. මේ කාලයේදී හොරාට උනත් තේරෙනවලු එයා කරන්නේ වැරදි වැඩක් කියලා.

අපි යම්කිසි දෙයක් දෙනකොට ආහාර හෝ සිවුරක් හෝ දෙනකොට ප්‍රිය මානප දෙයක් දෙන්න ඕනෑ. කවදාකවත් ඇඳලා ඇඳලා පරණ වෙච්චා ඒවා දිදී වීඩියෝ කරන්න යන්න හොඳ නෑ. හරි කැතයි ඒක. දෙනවා නම් කීයක් හරි වැඩිපුර දීලා හරි කඩයකින් අරගෙන අත් දෙකෙන් දෙන්න ඕනෑ. පරණ ඒවා දෙන්න හොඳ නෑ.


බෙහෙතක් උනත් expire වෙච්ච ඒවා දෙන්න හොඳ නෑ. Expire වෙන දිනය කපලා ඒකට අලුත් දිනයක් දාල දෙන්න හොඳ නෑ. දින පැනපු බෙහෙතක් හරි කෑමක් හරි මොකක් හරි දෙන්න හොඳ නෑ. Expire වෙච්ච ඒවා දෙන නිසා තමයි ඔය ජීවිත වල දික් කසාද වගේ ඒවා එන්නේ. පර මල් පූජා කරලා පරණ දේවල් දීලා ඒවගේම වැඩකට නැති දේවල් දුන්නහම තමයි ජීවිත වල ආකාලේ ඔය වගේ දේවල් සිද්ධ වෙන්නේ.

මේවා social දේවල් කියලා හිතන්න එපා, මේවාගේ අස්සේ තිබෙනවා ගැඹුරු ධර්මයක්. ඒක නිසා බුදුරාජාණන්වහන්සේ දේශනා කරනවා ආයුෂය වර්ණය යසස කීර්තිය උසස් තැන්වල ඉපදීම ආදී යම්කිසි නිවන දක්වාම ලැබෙන්න අවශ්‍ය දෙයක් තිබෙනවානම් බොරුවට හිත හිතා කියව කියවා හිටියට සත පහක දෙයක් අපිට හම්බ වෙන්නේ නෑ. අපිට කරන්න තිබෙන්නේ ඒවා හම්බවෙන හේතු සම්පාදනය කරන එක. ඒවා හම්බ වෙන පිං කියන කුසල් කියන credit හදන්න ඕනෑ. එහෙම හැදුවට පස්සේ තමයි ළගදීත් දුරදීත් නිවන් දකින තෙක් හැමතැනකම අපිට ඒවා හම්බ වෙන්නේ. ස්වර්ගසම්පත්තියත් අපිට නිකං හිතුවට හම්බවෙන්නේ නෑ. ඒක නිසා බුදුරාජාණන්වහන්සේ ආයුසංවත්තනික ප්‍රතිපදාව එනම් ආයුෂය ලැබෙන වැඩ පිළිවෙල, වර්ණය ලැබෙන වැඩ පිළිවල වණ්ණසංවත්තනික ප්‍රතිපදාව, සුඛසංවත්තනික ප්‍රතිපදාව එනම් සැප සම්පත් ලැබෙන්නා වූ වැඩ පිළිවල, යසසංවත්තනිකා පටිපදාව එනම් කිර්තිය ලැබෙන වැඩ පිළිවල, සග්ගසංවත්තනික පටිපදා කියන සැප සම්පත් ඇති මනුස්ස ලෝකයේ හෝ දිව්‍ය ලෝකයේ උපදින්න හේතුවෙන්නා වූ වැඩ පිළිවල පුරන්න ඕනෑ. මේ ටික ලැබුනට පස්සේ අපි ආර්ය ශ්‍රාවකයෝ හැටියට කෙළවර නිවන් දකින වැඩේ කරන්න ඕනෑ. ඒ තමයි දුක්ඛ නිරෝධ ගාමිනි ප්‍රතිපදාව.

ඉතින් මම මේ ටික කිව්වේ මේ පින්වතුන් හැම එක්කෙනාගේම හිත්වල තිබෙනවා යම්කිසි අධිෂ්ඨානයක් යම්කිසි ප්‍රාර්ථනාවක් ඕනෑකමක් හිතීමක්. නමුත් ඒවා හිතුවට හම්බවෙන්නේ නෑ. හැබැයි මම හිතන එකක් තිබෙනවා. නවසීලන්තයේ ඉන්න මිනිස්සු ටික කාටවත් ඊර්ෂ්‍යා කරන්නේ නැතුව යමක් හොඳයි කියලා අනිත් අයට ආශිර්වාද කරලා නිරෝගී බව ප්‍රාර්ථනා කරලා හිටපු පිරිසක්. ඒක නිසා තමයි මාස දෙකකට කොරෝනා වයිරසය නිසා වැඩසටහන නවත්වලා තිබුණාට අපි කොහොම හරි නැවත ඔක්තෝම්බර් වල පටන්ගත්තා. කොහොම හරි මේ පිරිසට අඩුවෙන් හරි වැඩියෙන් හරි ඒ වාසනාව තිබුණා.

අපි මේ කරන්නා වූ කුසල් බලයෙන් ඒ ශක්තිය ලැබේවා! අපි වඩන පිං බලයෙන් අපි වඩන කුසල් බලයෙන් අපි වඩන සීල බලයෙන් අපි භාවනා කරන භාවනා බලයෙන් හැම කෙනාටම ඉතාමත් පිරිසිදුව පැහැදිලිව ඒ උතුම් ධර්ම මාර්ගයේ යාගන්න ලැබේවා! නිරෝගී භාවය සැලසේවා! අපිටත් ලෝකයාට පිහිට වෙලා ලෝකයාගේ සිත් සනසාගෙන මනුස්සයන්ට දුකක් නොදී හිත් තලන්නේ නැතුව පෙළන්නේ නැතුව සන්තෝස කරගෙන ඒ අයගේ හිත්වලට ධර්මය කියලා දීලා ධර්මයෙන් පෝෂණය කරලා හේතු ඵල ධර්මයේ තිබෙන වටිනාකම ක්‍රියාකාරී ස්වභාවය කියලා දීලා අපිට මේ සංසාර දුකින් මිදිලා ලොව්තුරා බුදුරජාණන්වහන්සේ වහන්සේලා පසේ බුදුරාජාණන්වහන්සේලා මහා රහතන් වහන්සේලා අවබෝධ කරගත්ත සදාකාලික සැප ඇති අමාමහ නිවනින් සැනසෙන්න ලැබේවා! නිවන් පිණිස අපේ සියලු කුසල් හේතු උපකාර වේවා කියලා අපි අධිෂ්ඨාන කරගනිමු. හැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධූ! සාධූ!



ඉහත සඳහන් ධර්ම දේශනාව අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.